සමාජ සමීක්ෂා: සමාජීය විද්‍යා ශාස්ත්‍රීය ලිපි සංග්‍රය
ISSN 2478-0472
http://www.socialaffair.org

# ශ්‍රී ලංකාවේ දේශපාලන ප්‍රචණ්ඩත්වය

ගාමිණී සමරනායක*
දේශපාලන විද්‍යා අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පේරාදෙණිය

## හැඳින්වීම

දෙවන ලෝක මහා යුද්ධයෙන් පසු ලෝකයෙහි බොහෝ සංවර්ධනය වෙමින් පවතින රටවල දේශපාලන ව්‍යුහය තුළ, දේශපාලන ප්‍රචණ්ඩත්වය පිළිබඳ ගැටලුව ඉතා වැදගත් ප්‍රශ්නයක් වී ඇත. බොහෝ සංවර්ධනය වෙමින් පවතින රටවල් වෙතින් නිරන්තරවම හමුදා කුමන්ත්‍රණ (Military Coups), කැරලි කෝලාහල (Insurrections), ගරිල්ලා යුද්ධ (Guerrilla Wars), දේශපාලන ඝාතන (Political Assassination) සහ දේශපාලන ත්‍රස්තවාදය (Political Terroism) ප්‍රකටවේ. 1998 වන විට දී පමණක් තව දුරටත් ක්‍රියාත්මක වන දේශපාලන ප්‍රචණ්ඩත්වය හා සම්බන්ධ වූ අභ්‍යන්තර සිදුවීම් 36 ක් පමණ සංවර්ධනය වෙමින් පවතින රටවල් වෙතින් දක්නට ලැබී ඇත.

1948 දී බ්‍රිතාන්‍ය යටත් විජිත පාලනය වෙතින් නිදහස ලැබූ දින සිට ශ්‍රී ලංකාවේ දේශපාලන ව්‍යුහය තුළින්ද විවිධ ආකාරයෙහි දේශපාලන ප්‍රචණ්ඩත්වයන් දක්නට ලැබේ. මේ අතුරින් 1953 හා 1981 දී කම්කරු පන්තිය හා වෘත්තීය සමිති ව්‍යාපාරය මත පදනම් වූ හර්තාලය හා වැඩ වර්ජනය, 1956, 1958, 1977, 1979 හා 1983 දී ඇති වූ ජාතිවාදී අරගල, 1959 හා 1975 දී ඇති වූ දේශපාලන ඝාතන, 1965, 1969, 1976 හා 1984 දී ඇති වූ ශිෂ්‍ය අරගල සහ 1965, 1970, 1977 හා 1982 දී ඇති වූ පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩත්වයන්ද සඳහන් කළ හැකිය. ඒවාට අමතරව 1971 දී හා 1987 - 1989 දී වාම කැරලි හා 1970 ගණන්වල මැද භාගයේ සිට 2009 මැයි මස දක්වා ක්‍රියාත්මක වූ වෙනම රාජ්‍යයක් සඳහා වූ දේශපාලන ප්‍රචණ්ඩත්වයද ඉතා වැදගත් කොට සැලකිය යුතුය.

ඉහතින් සඳහන් කරනු ලැබූ විවිධ ආකාරයෙහි ප්‍රචණ්ඩත්වයන් අතුරින් සිංහල තරුණයන් මත පදනම් වූ වාම දේශපාලන කැරලි හා උතුරේ ද්‍රවිඩ තරුණයන් මත පදනම් වූ දේශපාලන ත්‍රස්තවාදය හා ගරිල්ලා යුද්ධයත්, 1970 මුල් භාගයේහි සිට ශ්‍රී ලංකාවේ දේශපාලනයෙහි ආධිපත්‍යය ගත්තේ ය.
මෙලෙස වර්ධනය වෙමින් පවතින දේශපාලන ප්‍රචණ්ඩත්වයන් හේතුවෙන් ජාතික දේශපාලන ආධිපත්‍යය පමණක් නොව, ශ්‍රී ලංකාවේ භෞමික ඒකාග්‍රතාවය හා ස්ථාපිත සමාජ ආර්ථික ක්‍රමයද අභියෝගයට ලක්ව ඇත. මේ අනුව ශ්‍රී ලංකාවේ දේශපාලන ප්‍රචණ්ඩත්වය පිළිබඳ ගැටලුව සම්බන්ධ පුළුල් අවබෝධයක්

*කර්තෘ විද්‍යුත් ලිපිනය: gsamaranayake2000@yahoo.com
© සමාජ සමීක්ෂා. This work is licensed under a Creative Commons Attribution-Non Commercial 4.0 International License.

ලබා ගැනීම සඳහා ඒ පිළිබඳ ඉතා ගැඹුරින් අධ්‍යයනය කිරීමේ අවශ්‍යතාවය ඉස්මතු වී ඇති බව පැහැදිලිය.

මෙම ලිපියෙහි ප්‍රධාන පරමාර්ථය වනුයේ දේශපාලන ප්‍රචණ්ඩත්වයෙහි මූලික හේතූන් හා එහි ස්වභාවය පරීක්ෂා කිරීම ය. එයට අමතර මෙම ලිපියෙන් ආණ්ඩු විසින් ප්‍රචණ්ඩත්වය පිළිබඳ ගැටලුව සම්බන්ධව දක්වනු ලැබූ ප්‍රතික්‍රියා පිළිබඳවත් ප්‍රචණ්ඩත්වය මඟින් ජනිත කොට ඇති සමාජ, ආර්ථික හා දේශපාලන ප්‍රතිඵල පිළිබඳවත් විමසා බලනු ලැබේ. මේ අනුව ප්‍රධාන වශයෙන් මෙම ලිපිය කොටස් පහකට බෙදා වෙන් කෙරේ. ලිපියෙහි පළමු කොටස වෙතින් දේශපාලන ප්‍රචණ්ඩත්වය හා සම්බන්ධිත කොන්දේසි හා සාධක විමසා බලනු ලැබේ. දෙවන කොටස තුළ දේශපාලන ප්‍රචණ්ඩත්වය හා සම්බන්ධිත සංවිධාන පිළිබඳ විමසා බලනු ලබන අතර තෙවන කොටසින් දේශපාලන ප්‍රචණ්ඩත්වයෙහි ස්වභාවය හා එහි මූලික ලක්ෂණයන් පිළිබඳ විමසනු ලැබේ. මෙහි හතරවන කොටස ආණ්ඩු විසින් දේශපාලන ප්‍රචණ්ඩත්වය සම්බන්ධව දැක්වූ ප්‍රතික්‍රියාවන් හා සම්බන්ධ වන අතර අවසන් කොටස දේශපාලන ප්‍රචණ්ඩත්වය විසින් ජනිත කොට ඇති ප්‍රතිවිපාක අධ්‍යයනය පිළිබඳ සමාලෝචනයකි. ඒ අනුව පළමුව දේශපාලන ප්‍රචණ්ඩත්වය හා සම්බන්ධිත කොන්දේසි පිළිබඳ විමසා බලමු.

## ප්‍රචණ්ඩ දේශපාලනයෙහි පූර්ව කොන්දේසි

දේශපාලන ප්‍රචණ්ඩත්වය හා සම්බන්ධිත සාධකයන් ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදා වෙන් කළ හැකිය. එනම් පූර්ව කොන්දේසින් හෙවත් දිගුකාලීන සාධකයන් හා ක්ෂණික හෙවත් කෙටිකාලීන සාධකයන් ය. දිගුකාලීන සමාජ ආර්ථික හා දේශපාලන සාධකයන් රහසිගත දේශපාලන සංවිධාන බිහිවීමට හා ව්‍යාප්ත වීමට දායක වන අතර දේශපාලන ප්‍රචණ්ඩත්වය ඇති කිරීම සඳහා කෙටිකාලීන සාධකයන් බලපානු ලැබේ. මෙහිදී ශ්‍රී ලංකාවේ පළමු රහසිගත ප්‍රචණ්ඩකාරී දේශපාලන සංවිධාන බිහිවීම හා වර්ධනය කෙරෙහි බලපෑ සමාජ ආර්ථික හා දේශපාලන සාධක පිළිබඳ විමසා බලනු ලැබේ.

## සමාජ සංචලතාවය

බ්‍රිතාන්‍ය යටත් විජිත පාලන කාලය තුළදී ආරම්භ කරනු ලැබූ සමාජ ආර්ථික හා දේශපාලන ප්‍රතිසංස්කරණයන් මගින් ශ්‍රී ලංකාවේ නවීකරණය පිළිබඳ ක්‍රියාවලියෙහි ආරම්භය පෙන්නුම් කරනු ලැබේ. ශ්‍රී ලංකාවේ පශ්චාත් නිදහස් යුගය තුළදී මෙම ක්‍රියාවලිය සිදු වූ ආකාරය හා ශ්‍රී ලංකාවේ සමාජ සංචලතාව ඇති වූ ආකරය සඳහන් කිරීමේ දී මූලික වශයෙන් ජනගහනයෙහි ව්‍යාප්තිය හා නාගරීකරණය, අධ්‍යාපනයෙහි ව්‍යාප්තිය, කෘෂිකාර්මික නොවන රැකියාවන්ගේ ව්‍යාප්තිය, සාක්ෂරතාවෙහි හා ජන සන්නිවේදන මාධ්‍යයන්ගේ වර්ධනය පිළිබඳ සැලකිලිමත් විය යුතුය. සමාජ සංචලතාව ආර්ථික හා දේශපාලන වර්ධනය යන සංදර්භය තුළ විමසා බැලිය හැකිය.

දෙවන ලෝක යුද්ධයට පසු ශ්‍රී ලංකාවේ ජනගහණය පිළිබඳ සීඝ්‍ර වර්ධනයක් දක්නට ලැබේ. වර්ෂ 1881 දී මිලියන 2.76 ක් වූ ශ්‍රී ලංකාවේ ජනගහනය 1981 වන විටදී මිලියන 15 දක්වා වර්ධනය විය. ශ්‍රී ලංකාව වාර්ෂික වශයෙන් 200,000 වැඩි ප්‍රමාණයක් තම ජනගහනයට ඒකරාශී කර ගනී. 1998 වන විටදී ශ්‍රී ලංකාවේ ජනගහනය මිලියන 17 ක් වන අතර 20 වන ශත වර්ෂය අවසන්වන විටදී එම ප්‍රමාණය මිලියන 20 දක්වා වර්ධනයවන බවට වාර්තාකොට ඇත. මෙලෙස ජනගහන වර්ධනය සම්බන්ධව උපත් අනුපාතයෙහි වර්ධනය හා මරණ අනුපාතයෙහි පහත වැටීමත් හේතුවී ඇත. එම කාරණය දෙවන මහා යුද්ධයෙන් පසුව ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සේවාවන්හි හා සුභසාධක සේවාවන්ගේ වර්ධනයෙහි ප්‍රතිඵලයක් වේ. 1950 ගණන්වලදී ශ්‍රී ලංකාව ලෝකයේ ඉහළ ජනගහන වර්ධනයක් තිබූ රටක් විය. ඒ කාලයේදී ජනගහන වර්ධනයෙහි වර්ධන ප්‍රමාණය සියයට 3.1 ක්වූ අතර වර්තමානයේ එය වාර්ෂික වශයෙන් සියයට 1.7 දක්වා පහළ වැටී ඇත.

ශ්‍රී ලංකාවේ ජනගහන වර්ධනයෙහි වැදගත්ම ලක්ෂණය වශයෙන් ජනගහන ව්‍යාප්තිය සඳහන් කළ හැකිය. ශ්‍රී ලංකාවේ ජනගහනයෙහි බහුතරය දකුණු, මධ්‍යම හා බස්නාහිර පළාත් හා සම්බන්ධවී ඇත. 1981 ජනගහනය අනුව මුළු

ජනගහනයෙන් 21.5% ක් නාගරිකය. 1998 වන විටදී එය 30% දක්වා වර්ධනය වී ඇති අතර 2010 දී එය 60% ක් දක්වා වර්ධනයවේ යැයි ප්‍රකාශ කර ඇත. ශ්‍රී ලංකාවේ ජනගහනය හා සම්බන්ධ වැදගත් ලක්ෂණයක් ලෙස අධි තරුණ ජනගහනයකින් සමන්විත වීම සඳහන් කළ හැකිය. 1964 දී වයස අවුරුදු 15 සහ 24 අයත් ප්‍රමාණය මිලියන 1.3 ක් වූ අතර 1971 වන විට දී එම ප්‍රමාණය මිලියන 2.6 දක්වා වර්ධනයවී ඇත. 1981 සංගණනයට අනුව එම ප්‍රමාණය මිලියන 3 ක් වේ.

ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයෙහි වර්ධනය සමාජ සංචලතාවයෙහි වැදගත් අංගයක් ලෙසට සඳහන් කළ හැකිය. මෙලෙස අධ්‍යාපනයෙහි වර්ධනය සම්බන්ධව 1945 දී ප්‍රාථමික අධ්‍යාපනයෙහි සිට විශ්වවිද්‍යාල අධ්‍යාපනය දක්වා නිදහස් අධ්‍යාපනය ඉදිරිපත් කිරීම හා 1960 දී රජය විසින් පාසල් පවරා ගනු ලැබීම දායක වී ඇත. 1945 සහ 1970 අතර කාලය තුළ දී ප්‍රාථමික හෝ ද්විතීයික අධ්‍යාපනය සම්බන්ධව ඇතුළු වූවන්ගේ ප්‍රමාණය 867,000 සිට 2,716,000 දක්වා වර්ධනය වී ඇත. 1959 දී ස්වභාෂා මාධ්‍යයන් මගින් විශ්වවිද්‍යාල අධ්‍යාපනය ද ආරම්භ විණි. එහි ප්‍රතිඵලයක් ලෙසට 1948 දී 1612 ක් වූ විශ්වවිද්‍යාල ශිෂ්‍ය සංඛ්‍යාව 1970 දී 14,000 දක්වා වර්ධනය විය. 1978 දී විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා ඇතුළු වූවන්ගේ සංඛ්‍යාව 17,449 ක් වූ අතර 1989/90 දී එය 22,480 ක් දක්වා වර්ධනයවී ඇත. 1998 දී එම ප්‍රමාණය 30,000 ක් වී ඇත. මෙලෙස විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබන්නන්ගේ සංඛ්‍යාවේ වර්ධනයට සාපේක්ෂව විශ්වවිද්‍යාල සංඛ්‍යාවද ක්‍රමානුකූලව ව්‍යාප්තවී ඇත. 1942 සිට 1962 දක්වා එක් විශ්වවිද්‍යාලයක් පමණක් පැවති අතර 1975 දී එය පහක් දක්වාත් සහ 1983 දී අටක් දක්වා වර්ධනය විය. මෙලෙස අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හේතු කොට ගෙන ග්‍රාමීය ජනගහනයෙන් බහුතරයකට අධ්‍යාපනය ලබා ගැනීමට හැකි විය.

ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයෙහි ව්‍යාප්තියට සමාන්තරව සාක්ෂරතාවද වර්ධනය වී ඇත. 1901 දී අවුරුදු පහක් හා එයට වැඩි කාන්තාවන්ගේ සාක්ෂරතාවය 8.5% ක් වූ අතර එම වයස් ප්‍රමාණයේ පිරිමින්ගේ සාක්ෂරතාව 42% ක් විය. 1971 දී වයස අවුරුදු 10 සහ එයට වැඩි කාන්තාවන්ගේ සාක්ෂරතාව 70.7% ක් වූ අතර එම වයස් ප්‍රමාණයේ පිරිමින්ගේ සාක්ෂරතාවය 85.2% ක් වී ඇත. 1997 දී සාක්ෂරතාව 92.1% කි.

නිදහසින් පසු ශ්‍රී ලංකාවේ සමාජ සංචලතාවෙහි නිශ්චිත වර්ධනය ව්‍යාප්තවන ජන සන්නිවේදන මාධ්‍යයන් වෙතින්ද පෙන්නුම් කරනු ලැබේ. 1941 දී බලපත්‍ර සහිත ගුවන් විදුලි යන්ත්‍ර සංඛ්‍යාව 467,000 වූ අතර 1991 එය මිලියන 4.7 දක්වා වර්ධනය වී ඇත. මෙයට අමතරව 1978 දී ශ්‍රී ලංකාවට රූපවාහිනිය හඳුන්වා දුන් අතර 1991 වන විට දී බලපත්‍ර රහිත 100,000 ක් සමඟ ටෙලිවිෂන් 700,000 ක් භාවිත විය. 1991 දී ශ්‍රී ලංකාව තුළ සිංහල, ද්‍රවිඩ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් ප්‍රසිද්ධ කරන දිනපතා පත්‍ර 33 ක් හා සඟරා 73 ක්ද භාවිත විය. මෙම ජන මාධ්‍යයන් ජනගහනයෙන් 1000 කට 150 ක් විසින් භාවිත කරනු ලැබිණි.

අධ්‍යාපනය පිළිබඳ සාධකය කාලාන්තරයක් තුළ සුදු කරපටි (White Collar) රැකියා ලබා ගැනීමේ පහසු මාර්ගයක් විය. ශ්‍රී ලංකාවේ ඉහළ සමාජ සංචලතාවෙහි ප්‍රතිඵලයක් වශයෙන් තරුණයන් අතර ඉතා වේගයෙන් අපේක්ෂාවන් ඇති විය. මේ අනුව එම ඉහළ අපේක්ෂාවන් හා බලාපොරොත්තු ඉටු කිරීම සඳහා උපරිම ආකාරයෙහි ආර්ථික වර්ධනයක් අත්‍යවශ්‍යව තිබුණි. එම කාරණය අවබෝධ කරගැනීම සඳහා 1960 සිට ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය පිළිබඳ විමසා බැලිය යුතුය.

## ආර්ථික වර්ධනය

1960 ගණන්වල මැද භාගයේ සිට ආර්ථික තත්ත්වය විමසීමේදී, ශ්‍රී ලංකාවේ සමාජ වෙනස් වීමවලට යෝග්‍යවන ලෙස ආර්ථිකයෙහි වර්ධනයක් ඇති වී නොමැති බව සඳහන් කළ හැකිය. ශ්‍රී ලංකාවේ ආර්ථිකය සාම්ප්‍රදායික ලෙස තේ, රබර් සහ පොල් මත පදනම් වූ කෘෂිකාර්මික හා වැවිලි ආර්ථිකයකි. ශ්‍රී ලංකාවේ මුළු අපනයන ආදායමෙන් 1/3 ක් පමණ ඉහත සඳහන් ද්‍රව්‍යයන්ගෙන් ලැබේ. මුළු ජනගහනයෙන් 50% ක් පමණ කෘෂිකාර්මික හෝ

එයට අදාළ සේවාවන් හා සම්බන්ධවී ඇත. 1970 සිට සංචාරක ව්‍යාපාරයද වැදගත් කර්මාන්තයක් බවට පත් විය.

සාර්ව ආර්ථික වශයෙන් සලකා බලන විටදී 1990 දී ශ්‍රී ලංකාවේ දළ ජාතික ආදායම රුපියල් බිලියන 285 කි. ඒක පුද්ගල ආදායම 1970 දී ඇමරිකානු ඩොලර් 120 සිට 1990 දී ඩොලර් 420 දක්වා වර්ධනයවී ඇත. ශ්‍රී ලංකා බැංකු වාර්තාවන්ට අනුව ශ්‍රී ලංකාවේ ආදායම් ව්‍යාප්තියෙන් අසමානුපාතිත්වයක් පෙන්නුම් කෙරේ. ජනගහනයෙන් 10% ප්‍රමාණය 1977 දී ශ්‍රී ලංකාවේ ආදායමෙන් 30% පාලනය කරන අතර 1989 වන විට දී එම ප්‍රමාණය 51% ක් දක්වා වර්ධනයවී ඇත. ලෝක බැංකු වාර්තාවකට අනුව 1970 අග භාගය වන විට ශ්‍රී ලංකාව ලෝකයෙහි අඩු ආදායම් ලබන දුප්පත් රටවල් 36 න් එක් රටකි.

විදේශ ණය හා ආධාර මත රඳා පැවතීම ශ්‍රී ලංකාවේ ආර්ථිකයෙහි ප්‍රධාන ලක්ෂණයකි. එයට අමතරව විදේශීය ණය අනුපාතිකය ඉතා සීඝ්‍රයෙන් වර්ධනය වී ඇත. මෙලෙස පරිහානියට පත්වන හා එකතැන පල්වන ශ්‍රී ලාංකික ආර්ථිකය, සමාජීය අපේක්ෂාවන් තෘප්තිමත් කිරීමට අපොහොසත්වී ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස 1960 ගණන්වල සිට ඉහළ ප්‍රතිශතයක විරැකියාවක් පෙන්නුම් කළේ ය. 1973 දී මුළු ශ්‍රම බලකායෙන් 24% ක් විරැකියාවට ගොදුරු වී ඇත. 1978 දී එම ප්‍රමාණය 14.5% ක් වූ අතර 1981 දී එය 11.7% දක්වා පහත වැටී ඇත. 1986/87 දී එම ප්‍රමාණය 15.5% දක්වා වර්ධනය වී ඇත. 1989 දී විරැකියාවහි ප්‍රමාණය මිලියන 1.2 කි. වාර්ෂික වශයෙන් රැකියා වෙළෙඳපොළට 135,000 ආධුනිකයන් එක් වෙති. 1997 දී මුළු ශ්‍රම බලකායෙන් 10.3% ක් රැකියා විරහිත වූවන් වේ. මේ අතුරින් වයස් අවුරුදු 19-25 අතර ප්‍රමාණයෙහි රැකියා විරහිත ප්‍රමාණය 32% කි.

මේ අයුරින් සමාජීය වෙනස්වීම්වලට සරිලන ලෙසට ආර්ථික වර්ධනයක් ඇති නොවීමේ ප්‍රතිඵලයක් ලෙස උගත් තරුණයන් අතර අපේක්ෂා භංගත්වයක් බිහි වී ඇත. සැමුවෙල් පී. හංටින්ටන්ගේ අදහසට අනුව රැකියා විරහිත වූවන්ගේ අධ්‍යාපන මට්ටම ඉහළ යන ප්‍රමාණයට පරාරෝපණය හෝ අතෘප්තිකර පුද්ගලයන්ගේ සංඛ්‍යාවද වර්ධනය වේ. එම තත්ත්වයන් හේතුවෙන් ඇති විය හැකි ප්‍රතිඵලය වනුයේ පෙරළිකාර චර්යාවකි. වැඩි දුරටත් ඔහුට අනුව පරාරෝපණය වූ විශ්වවිද්‍යාල උපාධිධාරීන් විප්ලවයකට සූදානම්වන අතර පරාරෝපණය වූ කාර්මික හෝ ද්විතීයික අධ්‍යාපනය ලැබූවෝ කුමන්ත්‍රණ සැලසුම් කරති. මේ අයුරින් ආර්ථිකයේ ඌන සංවර්ධනය හේතු කොට ගෙන ශ්‍රී ලංකාවේ සමාජ සංචලතාවෙහි ව්‍යාප්තිය මගින් සමාජ අපේක්ෂා භංගත්වයක් බිහිකොට ඇත. මෙහි ප්‍රතිඵලය වී ඇත්තේ තරුණයන් බහුල වශයෙන් දේශපාලනයට ආදේශ වීමය. එබඳු වාතාවරණයක දී දේශපාලනයට සම්බන්ධ වූ තරුණයන් ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමයට අවශෝෂණය කර ගැනීම සඳහා සංවර්ධනය වූ දේශපාලන ක්‍රමයක් තිබිය යුතුය. එම නිසා මෙතැන් සිට මෙම ලිපිය මගින් ශ්‍රී ලංකාවේ දේශපාලන නවීකරණයහි ස්වභාවය පිළිබඳ විමසිලිමත් වේ.

## දේශපාලන නවීකරණය

ශ්‍රී ලංකාවේ පශ්චාත් නිදහස් ආණ්ඩුක්‍රම ව්‍යුහය 1948 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මත පදනම් විය. එය මූලික වශයෙන් බ්‍රිතාන්‍ය ස්වරූපයේ පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයකි. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙතින් ද එහි මූලික ස්වරූපයෙන් වෙනස් නොවීය. 1978 ආණ්ඩුක්‍රම ව්‍යස්ථාව වෙතින් එතෙක් භාවිත කළ කැබිනට් විධායකය, ජනාධිපති විධායක ක්‍රමයක් බවට පරිවර්තනයකොට ඇත. ශ්‍රී ලංකාවේ දේශපාලන නවීකරණය කෙරෙහි බලපෑ ප්‍රධාන සාධකයක් වශයෙන් සර්වජන ඡන්ද බලය සඳහන් කළ හැක. 1931 දී හඳුන්වා දුන් සර්වජන ඡන්දබලය නිසා දේශපාලන සහභාගීත්වය පුළුල් විය. 1959 දී ඡන්ද බලය හිමි වයස් සීමාව අවුරුදු 21 සිට 18 දක්වා පහත දැමීම හේතු කොට ගෙන මැතිවරණ දේශපාලනය තුළ තරුණ සහභාගීත්වයද පුළුල් වූයේ ය.

ශ්‍රී ලංකාවේ එලෙස පුළුල් වෙමින් තිබූ දේශපාලන සහභාගීත්වය හා වර්ධනය වෙමින් පැවති ඉල්ලුම් හා සම්බන්ධව ප්‍රතිචාර දැක්වීමට දේශපාලන ක්‍රමයට තිබූ හැකියාව දේශපාලන

පක්ෂ ක්‍රමය වෙතින් විමසා බැලිය හැකිය.

ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමයේ වර්ධනය සඳහා 1931 දී සර්වජන ඡන්දය ලබාදීම, 1948 දී බ්‍රිතාන්‍ය වෙතින් නිදහස ලබා ගැනීම හා වෙස්ට් මිනිස්ටර් ආකෘතියේ පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයක් භාවිත කිරීමට හේතු වී ඇත. ශ්‍රී ලංකාවේ ප්‍රධාන විකල්ප ආණ්ඩු පක්ෂය වශයෙන් එක්සත් ජාතික පක්ෂය හා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සඳහන් කළ හැකිය. එක්සත් ජාතික පක්ෂය 1947 සිට 1956 දක්වාත්, 1965 සිට 1977 දක්වාත්, සහ 1977 සිට 1994 දක්වාත් ආණ්ඩු කර ඇත. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය 1956 සිට 1965 දක්වාත් 1970 සිට 1977 දක්වාත් ආණ්ඩු කර ඇති අතර 1994 සිට අද දක්වාත් ආණ්ඩු බලය පවත්වා ගෙන ඇත. අනෙකුත් මැතිවරණ හා දේශපාලන හා සම්බන්ධිත ප්‍රධාන දේශපාලන පක්ෂ වශයෙන් ලංකා සමසමාජ පක්ෂය, ලංකා කොමියුනිස්ට් පක්ෂය, මහජන එක්සත් පෙරමුණ, ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණ හා ද්‍රවිඩ සංගමය සඳහන් කළ හැක. එමෙන්ම 1947 සිට 1977 දක්වා මැතිවරණයන්හි දී ස්වාධීන අපේක්ෂකයින්ගේ සංඛ්‍යාවේ පහත වැටීමෙන් දේශපාලන පක්ෂ ක්‍රමයේ වර්ධනය පෙන්නුම් කරයි. එසේ වුවද 1970 ට පෙර දේශපාලන පක්ෂ ක්‍රමයේ ක්‍රියාකාරීත්වය සහ ස්වභාවය ජනතා විමුක්ති පෙරමුණ හා එක්සත් විමුක්ති කොටි සංවිධානය වැනි රහසිගත දේශපාලන සංවිධානය බිහි වීමට දායක වී ඇත.

ශ්‍රී ලංකාවෙහි දේශපාලන කාර්යයන් සමාජ චලනතාවයෙහි මාර්ගයකි. එනමුත් ව්‍යාප්ත වූ දේශපාලන සහභාගීත්වය තුළින් දේශපාලනික වශයෙන් ඉස්මතුවී ඇති පුද්ගලයින් අවශෝෂණය කර ගැනීමට කිසිඳු දේශාපාලන පක්ෂයක් සමත්වී නොමැත. සියලු ප්‍රධාන දේශපාලන පක්ෂයන්හි නායකත්වය ප්‍රභූ සමාජ පසුබිමකින් යුත් දේශපාලකයින් හෝ එම පවුල්වල සාමාජිකයන්ගෙන් සමන්විත විය. එම කිසිඳු දේශපාලන පක්ෂයක ප්‍රතිපත්ති සම්පාදනය සම්බන්ධව මැදිහත් වීමේ හැකියාවක් විශේෂයෙන්ම ග්‍රාමීය තරුණයන් වෙත ලැබී නොමැත. බොහෝ දේශපාලන පක්ෂ බිහිවී අවුරුදු 40 ක් පමණ ඉක්ම වුවද තව දුරටත් එහි නායකත්වය පුරෝගාමී නායකයින්ට හෝ ඔවුන්ගෙන් පැවතෙන්නන්ට හිමිව ඇත. දේශපාලන පක්ෂ නායකත්වය හා තරුණයන් අතර දක්නට ඇති පරම්පරා පරතරය ජාතික රාජ්‍ය සභාවේ නියෝජිතයන්ගේ වයස් ප්‍රමාණය සැලකීමේදී දක්නට ලැබේ. ජාතික රාජ්‍ය සභාවේ නියොජිතයින්ගෙන් 5% ක් පමණ වයස අවුරුදු 35 ට අඩු ය. මෙලෙස ප්‍රභූ පංතියෙන් සමන්විතවූ දේශපාලන පක්ෂ නායකත්වයට නව පරම්පරාවට අයත් තරුණයන් මුහුණ දෙන සමාජ ආර්ථික ගැටලු සම්බන්ධව අවබෝධයක් ලබා ගැනීමට නොහැකි වූවා පමණක් නොව, ඔවුන් පවතින දේශපාලන ක්‍රමයට අවශෝෂණය කර ගැනීමටද අපොහොසත් විය. මෙම තත්ත්වය හේතු කොට ගෙන ශ්‍රී ලංකාවේ දේශපාලන ක්‍රමය වෙතින් දේශපාලනය සංවර්ධනයකට වඩා ඌණ සංවර්ධනයක් පෙන්නුම් කරන බව සඳහන් කළ යුතුයි.

ශ්‍රී ලංකාවේ දේශපාලන ඌණ සංවර්ධනය පෙන්නුම් කරන එක් ප්‍රධාන ලක්ෂණයක් වශයෙන් පූර්ව හා පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩත්වය සඳහන් කළ හැකිය. 1947 සිට පවත්වනු ලැබූ සෑම මැතිවරණයකදී ම යම් ප්‍රමාණයක ප්‍රචණ්ඩ සිදුවීම් වාර්තාවී ඇත. 1965 සිට මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා වඩාත් සැළසුම්ගත හා සංවිධානාත්මක ස්වරූපයක් ගත් අතර 1977 සිට මෙම ප්‍රචණ්ඩත්වය මුළු දිවයින පුරාම ව්‍යාප්තවෙමින් එහි විනාශකාරීභාවයද වර්ධනයවී ඇත. මෙහිදී නිවාස කොල්ලකෑම්, ගිනි තැබීම්, පුද්ගලික දේපළ විනාශ කිරීම්, ස්ත්‍රී දූෂණ සහ මිනී මැරීම් වැනි බරපතල අපරාධ සිදුවී ඇත. 1977 දී පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩ සිදුවීම් පිළිබඳ පැමිණිලි 5600 වාර්තාවී ඇති අතර 1988 ජනාධිපති මැතිවරණයේ පුද්ගලයින් 700 ක් මිය ගොස් ඇත. මැතිවරණයන්හිදී ආණ්ඩු පක්ෂය විසින් මැතිවරණ අක්‍රමිකතාවන් සිදු කරන බවට විරුද්ධව පක්ෂ විසින් චෝදනා කරනු ලැබේ.

1950 දශකයේ මැද භාගයේ සිට ජනවාර්ගික ප්‍රචණ්ඩත්වය ද දේශපාලන ප්‍රචණ්ඩත්වයට දායක වූ සාධකයකි. එය පිළිවෙලින් 1956, 1958, 1977, 1979 යන වර්ෂයන්හිදී හා මහා පරිමාණ වශයෙන් 1983 දී සිදු වී ඇත. 1977 ට පෙර පැවති

ජාතිවාදී ප්‍රචණ්ඩත්වයන් ෆෙඩරල් පක්ෂය විසින් ඉල්ලා සිටිනු ලැබූ ෆෙඩරල් ආණ්ඩු ක්‍රමය පිළිබඳ ඉල්ලීම සමඟ හා 1977 න් පසු ප්‍රචණ්ඩත්වයන් වෙනම රාජ්‍ය පිළිබඳ ද්‍රවිඩ තරුණ සංවිධානයන්ගේ ඉල්ලීම සමඟ සම්බන්ධවී ඇත. පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩත්වයන් දකුණේ දේශපාලන ප්‍රචණ්ඩත්වයට බලපා ඇති අතර ජනවාර්ගික ප්‍රචණ්ඩත්වය උතුරේ ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධව බලපා ඇත.

මේ අනුව සාමාජීය සංචලතාවයට සමානුරූපීව ආර්ථික හා දේශාපාලන වර්ධනයක් නොවීම පිළිබඳ තත්ත්වය දිගුකාලීන වශයෙන් රහසිගත ආයුධ සන්නද්ධ දේශපාලන ව්‍යාපාරයන් බිහිවීමට උපස්ථම්භකවී ඇති බව සඳහන් කළ හැකිය. දේශපාලන ප්‍රචණ්ඩත්වය හා සම්බන්ධිත කෙටි කාලීන සාධකයන් ප්‍රධාන වශයෙන් සංවිධානාත්මක කණ්ඩායම් ආයුධ සන්නද්ධ අරගලයකට සූදානම් වීම සහ ආණ්ඩුව එයට ප්‍රතික්‍රියා දැක්වීමට සූදානම් වීම පිළිබඳ ක්‍රියාවලියේ දී උද්ගත වී ඇත. ආණ්ඩු විසින් දේශපාලන සංවිධානයන් ආයුධ සන්නද්ධ අරගලයන් සඳහා කරනු ලබන සූදානම නීතිය හා සාමයට තර්ජනයක් වශයෙන් සලකන අතර සංවිධානයන් විසින් ආණ්ඩුවෙහි ක්‍රියාකලාපය තමන්ගේ පැවැත්මට එරෙහිව සිදු වන මර්දනයක් ලෙසට අර්ථකථනය කෙරේ.

## සංවිධාන හා පරමාර්ථ

ශ්‍රී ලංකාවේ දේශපාලන ප්‍රචණ්ඩත්වයන් හා සම්බන්ධිත ප්‍රධාන සංවිධානයන් ලෙස ජනතා විමුක්ති පෙරමුණ හා ද්‍රවිඩ විමුක්ති කොටි සංවිධානය සඳහන් කළ හැක. ඒ අනුව ශ්‍රී ලංකාවේ දේශපාලන ප්‍රචණ්ඩත්වය පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී ඒවායේ ආරම්භය, මූලික පරමාර්ථ යනාදිය සම්බන්ධව විමසා බැලිය යුතුය. ඒවාට අමතරව ඒවායේ සාමාජිකත්වයෙහි සමාජ-ආර්ථික පසුබිම පිළිබඳවද පරීක්ෂාකර බැලිය යුතුය. පළමුව ජනතා විමුක්ති පෙරමුණ හා ද්‍රවිඩ විමුක්ති කොටි සංවිධානයෙහි ආරම්භය, වර්ධනය සහ අරමුණ පිළිබඳ විමසා බලමු.

ජනතා විමුක්ති පෙරමුණ, 1965 අතර කාලයේ මාවෝවාදී කොමියුනිස්ට් පක්ෂයෙන් ඉවත්වූ තරුණයන් කණ්ඩායමක් විසින් පිහිටුවා ගෙන ඇත. පළමුව රහසිගත සංවිධානයක් ලෙසින් බිහි වූ එය පසුව විවෘත දේශපාලන පක්ෂයක් ලෙසටද ක්‍රියාත්මක විය. මෙහි ඓතිහාසික විකාශනය, අවබෝධ කර ගැනීමේ පහසුව සඳහා කොටස් තුනකට බෙදා වෙන් කළ හැකිය.

එහි පළමු අදියරය, ආරම්භයේ සිට 1977 දක්වා කාලයට අයත්වේ. මෙම කාලයේ 1970 මැයි මාසයේ සිට 1971 අප්‍රේල් මාසය හැර ජ.වි.පෙ. රහසිගත දේශපාලන සංවිධානයක් ලෙසට ක්‍රියාත්මක වූහ. 1971 දී ජ.වි.පෙ. තම පළමු ආයුධ සන්නද්ධ අරගලය දියත් කළේ ය. ජ.වි.පෙ. හි විකාශනයෙහි දෙවන අදියර වශයෙන් 1977 සිට 1990 දක්වා කාලය දැක්විය හැකිය. මෙහිදී පළමුව ජ.වි.පෙ. පාර්ලිමේන්තු මැතිවරණ පක්ෂයක් ලෙසට හැඩ ගැසීමට උත්සාහ කරනු ලැබූ අතර 1982 ජනාධිපති වරණයටද ඉදිරිපත් විය. 1983 ජාතිවාදී අරගලය සම්බන්ධව තහනම් කිරීමෙන් පසු 1994 දක්වා රහසිගත පක්ෂයක් ලෙසට ක්‍රියාත්මක වූ අතර 1987-89 දී දෙවන ආයුධ සන්නද්ධ අරගලය මෙහෙයවීය. එහිදී ජනවාර්ගික අරගලයට පිළියම් වශයෙන් ඉදිරිපත්වූ ඉන්දු ලංකා ගිවිසුම, ඉන්දියානු සාම හමුදාව හා පළාත් සභා ක්‍රමය හා සම්බන්ධ පැවති මහජන විරෝධය, ජ.වි.පෙ. විසින් භාවිත කළේ ය. 1994 සිට අද දක්වා එම කාලය ජ.වි.පෙ. විකාශනයෙහි තෙවන අදියර වේ. එහිදී මැතිවරණ හා සම්බන්ධ විවෘත දේශපාලන පක්ෂයක් ලෙසට ක්‍රියාත්මක වේ.

ජ.වි.පෙ. හි ප්‍රධානතම දේශපාලන පරමාර්ථය ආයුධ සන්නද්ධ විප්ලවයක් මගින් මෙතෙක් බලයේ සිටි රාජ්‍යයන් ඉවත් කොට සමාජවාදී සමාජයක් බිහි කිරීමයි. එය දේශපාලනමය මෙන්ම සමාජ පරමාර්ථයකි. මෙහි දී ජ.වි.පෙ. විසින් නව දේශපාලන සාරධර්ම මෙන්ම සමාජ ආර්ථික ව්‍යුහයක් බිහිකිරීමට අපේක්ෂා කොට ඇත. මේ අනුව රාජ්‍ය හා එහි අධිකාරීත්වය පමණක් නොව දේශපාලන සමාජය වෙනස් කිරීමද ඔවුන්ගේ දේශපාලන කාර්යන්හි ප්‍රධාන ඉලක්කය බවට පත්ව ඇත.

ද්‍රවිඩ විමුක්ති කොටි සංවිධානය පෙඩරල්

පක්ෂයෙහි හා ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණෙහි තරුණ හා ශිෂ්‍ය අංශයන්ගෙන් බිහි ආවකි. ආරම්භයේදී ද්‍රවිඩ විමුක්ති කොටි සංවිධානය වැනි වෙනත් සංවිධාන 35 කට වඩා පැවතුණි. ඒ අතුරින් ද්‍රවිඩ විමුක්ති කොටි සංවිධානය (LTTE), ද්‍රවිඩ ඊලාම් ජනතා විමුක්ති සංවිධානය (PLOTE), ඊලාම් ජනතා විප්ලවීය විමුක්ති පෙරමුණ (EPRLF), ඊලාම් විප්ලවීය ශිෂ්‍ය සංවිධානය (ERSO) හා ද්‍රවිඩ ඊලාම් විමුක්ති සංවිධානය(LELO) බලවත් වූහ. 1978 ඉංදු ශ්‍රී ලංකා ගිවිසුමට පසු ද්‍රවිඩ විමුක්ති කොටි සංවිධානය හැර අන් සියළුම සංවිධාන දේශපාලන ප්‍රචණ්ඩත්වයෙන් ඉවත්වී මැතිවරණ දේශපාලනයට අවතීරණ විය. ද්‍රවිඩ විමුක්ති කොටි සංවිධානය දකුණු ආසියාවේ ප්‍රබලතම ගරිල්ලා සංවිධානයි. ඔවුන්ගේ මූලික දේශපාලන පරමාර්ථය වනුයේ ආයුධ සන්නද්ධ අරගලයක් මඟින් උතුර හා නැගෙනහිර පළාත් සම්බන්ධව ස්වාධීන වූ ද්‍රවිඩ රාජ්‍යයක් පිහිටු වීමය.

## සමාජ ආර්ථික පසුබිම

ශ්‍රී ලංකාවේ දේශපාලන ප්‍රචණ්ඩත්වය අධ්‍යයනය කිරීමේදී ඒ හා සම්බන්ධිත සංවිධානයන්හි සාමාජිකත්වයෙහි සමාජ ආර්ථික පසුබිමද විමසා බැලිය යුතුය. මෙහිදී පළමුව 1971 අප්‍රේල් අරගලය ආශ්‍රිතව ජ.වි.පෙ. සාමාජිකත්වයන්හි ජනවාර්ගික, ආගමික, ග්‍රාමීය හෝ නාගරික කුල හා වෘත්තීමය පසුබිම විමසා බැලිය හැක. මහාචාර්ය ගණනාථ ඔබේසේකර 1971 අප්‍රේල් අරගලය හා සහභාගීත්වයන්හි පසුබිම හා සම්බන්ධව සමීක්ෂණයක් කර ඇත. එම සමීක්ෂණයට අනුකූලව ජනවර්ගයන් අතර බහුතරය සිංහල වන අතර ආගමික බහුතරය බෞද්ධයෝ වෙති. 1971 අප්‍රේල් අරගලය හා සම්බන්ධවූවන්ගෙන් 9.28% ක් අවුරුදු 16 - 32 වයස් ප්‍රමාණයට අයත් වෙති. නියත වශයෙන්ම අරගලය හා සම්බන්ධව සහභාගවූවන්ගේ නාගරික හෝ ග්‍රාමීය පසුබිම සම්බන්ධව දත්ත නොමැත. එසේ වුවද ඔවුන් අධ්‍යාපනය ලැබූ පාසල් හා සම්බන්ධව පරීක්ෂා කර බැලීමේදී ඒ සම්බන්ධව අවබෝධයක් ලබාගත හැක. 85% ක් පමණ ජ.වි.පෙ. සාමාජිකත්වය මධ්‍ය මහා විද්‍යාලය නැතහොත් මහා විද්‍යාලයන්හි අධ්‍යාපනය ලබා ඇත. මේ අනුව ඔවුන් බහුල වශයෙන් ග්‍රාමීය පසුබිමකින් පැවත එන තරුණයන් වශයෙන් හඳුනාගැනේ.

1971 අරගලය හා සම්බන්ධවූවන්ගේ වෘත්තිය පසුබිම සැලකීම මගින් ඔවුන්ගේ ආර්ථික පසුබිම පිළිබඳ අවබෝධයක්ද ලබා ගත හැකිය. මහාචාර්ය ගණනාථ ඔබේසේකරගේ සමීක්ෂණයට අනුව එහි බහුතරය පහළ මධ්‍යම පාන්තික වෘත්තීන්හි නියුක්තවූවෝ වෙති. මේ අනුව 1971 අගරලය හා සම්බන්ධ මැදිහත්වූවන්ගෙන් බහුතරය සිංහල බෞද්ධ ග්‍රාමීය පසුබිමකින් යුක්ත පහළ මධ්‍යම පාන්තික වෘත්තීන්ට අයත් තරුණයන්ගෙන් සමන්විතය.

ජ.වි.පෙ.හි සමාජ ආර්ථික පසුබිම විමසීමේදී කුලය පිළිබඳ සාධකයද වැදගත් කොට සැලකිය හැකිය. තරුණයන් පිළිබඳ ජනාධිපති කොමිෂන් වාර්තාවේද කුල පීඩනය දේශපාලන ප්‍රචණ්ඩත්වයට දායකවී ඇති බව සඳහන්ය. මහාචාර්ය ගණනාථ ඔබේසේකරගේ සමීක්ෂණයට අනුව 1971 අරගලය හා සම්බන්ධ වූවන්ගෙන් 50% ක් පමණ ගොවිගම කලයට අයත් වූවන් ය. එසේ වුවද ප්‍රචණ්ඩකාරී සිදුවීම් බහුලව සිදුවී ඇත්තේ බත්ගම හා වහුම්පුර යන කුල ජනගහනයන් බහුලව ඇති ප්‍රදේශවලය.

මෙතෙක් ජ.වි.පෙ. දෙවන කැරැල්ල හා සම්බන්ධවූවන් පිළිබඳ සමීක්ෂණයක් සිදුවී නොමැත. එසේ වුවද ලැබී ඇති තොරතුරුවලට අනුව 1987-89 කැරැල්ල හා සම්බන්ධවූවන්ගේ සමාජ ආර්ථික පසුබිම 1971 කැරැල්ල හා සම්බන්ධ වූවන්ට සමානවේ. ජ.වි.පෙ. සාමාජිකත්වයෙහි සමාජ ආර්ථික තොරතුරුවලට සාපේක්ෂව සැලකීමේදී ද්‍රවිඩ විමුක්ති කොටි සංවිධානයෙහි සමාජ ආර්ථික පසුබිම සම්බන්ධ තොරතුරු විරලය. ජනවාර්ගික වශයෙන් ඔවුන් සම්පූර්ණයෙන්ම පාහේ ශ්‍රී ලාංකික ද්‍රවිඩයන්ගෙන් සමන්විතය. ආගමික වශයෙන් සැලකීමේදී හින්දුය. එසේ වුවද යම් ප්‍රමාණයක ද්‍රවිඩ ක්‍රිස්තියානි ආගමිකයන්ගේ මැදිහත් වීමක් ඇතැයි විශ්වාස කරනු ලැබේ. ජ.වි.පෙ. මෙන්ම මෙහි සාමාජිකත්වයද බහුතර වශයෙන් තරුණයන්ගෙන් සමන්විතය. එය නිශ්චිත වශයෙන් ද්‍රවිඩ ජාතීන් විසින් ඔවුන්ව ළමුන් (Boys) ලෙස සලකනු ලැබීම තුළින් පෙන්නුම්

කෙරේ.

ද්‍රවිඩ විමුක්ති කොටි සංවිධානය ජනවාර්ගිකත්වය මත පදනම්වී ඇති බැවින් එහි සාමාජිකත්වයෙහි ආර්ථික පසුබිම නිශ්චිත වශයෙන්ම ප්‍රකාශ කිරීම දුෂ්කර කාර්යකි. එහි සාමාජිකත්වය මගින් ද්‍රවිඩ සමාජයේ සෑම ස්ථරයක්ම නියෝජනය වේ. එහෙත් ප්‍රායෝගික වශයෙන් දේශපාලන ප්‍රචණ්ඩත්වය හා මැදිහත්වූවන්ගේ බහුතරය පහළ මධ්‍යම පංතියෙන් සමන්විත ය.

එහි කුල සාමාජිකත්වයද නිශ්චිත වශයෙන් ප්‍රකාශ කිරීම දුෂ්කර වූවකි. මුල් කාලයේදී ද්‍රවිඩ විමුක්ති කොටි සංවිධානයෙහි සාමාජිකත්වය බහුල වශයෙන් වෙල්වෙට්තුරේ, වඩමාරච්චි හා පේදුරුතුඩුව යන මුහුදු බඩ පළාත් වෙතින් පැමිණ ඇත. මේවා උතුරු පළාතේ ප්‍රධාන ධීවර ප්‍රදේශයන්ය. මේ අනුව නායකත්වයෙහි හා සාමාජිකත්වයෙහි බහුතරය කරියර් (Kariyar) කුලයෙන් සමන්විතව ඇත. එයට අමතරව එහි වෙල්ලාල (Vellalar) හා කෝවියර්(Koviyar) කුලයන්ද නියෝජනය වේ. 1987 ඉංදු ලංකා ගිවිසුමට පසු ක්‍රියාත්මකවූ එකම ගරිල්ලා සංවිධානය වීම හේතු කොට ගෙන, මෙහි කුල සංයුතිය පුළුල් වී ඇත.

## දේශපාලන මතවාදය හා උපාය උපක්‍රම

දේශපාලන මතවාදය වෙතින් ජ.වි.පෙ. සහ ද්‍රවිඩ විමුක්ති කොටි සංවිධානයෙහි දේශපාලන පරමාර්ථ යුක්ති සහගතකොට විග්‍රහ කරනු ලැබේ. ඒවාහි උපාය උපක්‍රම වෙතින් රාජ්‍ය බලය ලබා ගැනීමේ ආකාරය පැහැදිලි කරනු ඇත. මෙම සංවිධානයන් දෙකම දේශපාලන වශයෙන් න්‍යායාත්මක නොවූ ප්‍රායෝගික හා ක්‍රියාත්මක කණ්ඩායම් වේ. ඔවුන්ගේ දේශපාලන මතවාද ජනවාර්ගික ජාතිවාදයෙහි හා මාක්ස්වාදයෙහි විවිධ අර්ථකථනයන්හි මිශ්‍රණයකි.

ජ.වි.පෙ. වෙතින් නිශ්චිත වශයෙන්ම වර්ධනයවූ දේශපාලන මතවාදයන් දක්නට නැති අතර එය බොහෝ දුරට ස්වරූපයෙන් සාරසංග්‍රහවාදයකි. ජ.වි.පෙ. තම දේශපාලන මතවාදය යනු මාක්ස්-ලෙනින් වාදය දේශීය තත්ත්වයන්ට ගැළපෙන ආකාරයට හැඩගැසීමක් ලෙසට විශ්වාස කෙරේ. එයට අමතරව මාඕ සේතුං හා චේගුවේරාගේ අදහස්ද ජ.වි.පෙ. දේශපාලන මතවාද හැඩගැසීම කෙරෙහි බලපා ඇත. ඒ තුළ අන්තර්ගත වන්නේ සිංහල බෞද්ධ ජාතිවාදය බව ජ.වි.පෙ. විසින් බහුලව භාවිත කෙරෙන "මව්බිම නැත්නම් මරණය" යන සටන් පාඨයෙන් පෙන්නුම් කරයි. ජ.වි.පෙ. මූලික වශයෙන් ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථානුකූල සමාජ-ආර්ථික වෙනස්වීම්වලට එරෙහි වූ දේශීය විරෝධතාවයකි. මේ අනුව බටහිර විරෝධී ඉන්දියානු විරෝධී හා පවතින තත්ත්වයට විරුද්ධවූ දේශපාලන මතවාදයක් ඉදිරිපත්වී ඇත.

ජ.වි.පෙ. උපාය උපක්‍රම කෙටි කාලයකදී ආයුධ සන්නද්ධ අරගලයක් මගින් බලය ලබා ගැනීමේ අරමුණ මත පදනම්වී ඇත. න්‍යායාත්මක වශයෙන් එය චේගුවේරා ආකෘතියේ ග්‍රාමීය ගරිල්ලා යුධ සහ කාලෝ මරිහෙලා ආකෘතියෙහි ග්‍රාමීය හා නාගරික ගරිල්ලා යුධයෙහි මිශ්‍රණයකි. ඒ අනුව කැරැල්ලෙහි අවසන් අදියරයවන තෙක්ම සාමාන්‍ය මහජනතාවට ඒ හා සම්බන්ධ මැදිහත් වීමේ අවකාශයක් ඇත්තේ නැත.

ජ.වි.පෙ. සහ ද්‍රවිඩ විමුක්ති කොටි සංවිධානය අතර සමාන මූලාශ්‍රයක් හා සමාජ ආර්ථික පසුබිමක් පවතින අතර දේශපාලන මතවාදය බොහෝ දුරට සමානය. එහි දේශපාලන මතවාදයෙහි හරය සිංහල හා ද්‍රවිඩ ජාතිවාදයෙහි හා මාක්ස්වාදයෙහි මිශ්‍රනයකි. ජ.වි.පෙ. මතවාදයෙහි "මව්බිම" යන පදය බහුලව භාවිත කෙරෙන අතර ද්‍රවිඩ විමුක්ති කොටි සංවිධානය විසින් "සාම්ප්‍රදායික නිජබිම" යන පදය භාවිත කරනු ලැබේ.

ද්‍රවිඩ විමුක්ති කොටි සංවිධානයෙහි දේශපාලන මතවාදය පිළිබඳ විමසීමේදී එහි උපාය උපක්‍රම වැදගත්ය. එය න්‍යායාත්මක ලෙස මාඕ සේතුං, චේගුවේරා හා කාලෝ මරිහෙලාගේ අදහස් මත හැඩගැසී ඇත. එල්.ටී.ටී.ඊ සංවිධානය විසින් ගරිල්ලා යුද්ධයක් මගින් ආරම්භ කරනු ලබන මහජන යුද්ධය වෙනම රාජ්‍යයක් ලබා ගැනීමේ ඉතාම ඵලදායක මාර්ගය වශයෙන් කල්පනා කෙරේ. මේ අනුව ගරිල්ලා යුද්ධය මගින් මහජනතාවට ජාතික විමුක්ති යුද්ධය හා සමාජවාදී විප්ලවය සඳහා දේශපාලන ලෙස

දැනුවත් කිරීම ඔවුන්ගේ අරමුණවේ. මෙහිදී ඔවුන් විසින් මහජනතාව වෙතින් යුද්ධයට මැදිහත් වීමට වඩා සහයෝගය පමණක් අපේක්ෂා කෙරේ.

## වැදගත්කම හා ස්වභාවය

ශ්‍රී ලංකාවේ දේශපාලන ප්‍රචණ්ඩතයේ ආරම්භය හා ස්වරූපය පිළිබඳ විමසා බැලීමේදී ඒවා එකිනෙකින් වෙනස්වන බව සඳහන් කළ හැක. ජ.වි.පෙ. විසින් 1971 දී දියත් කරනු ලැබූ පළමු කැරැල්ල සහ 1987-89 දී දියත් කළ දෙවැනි කැරැල්ල වෙතින් විප්ලවකාරී දේශපාලන ප්‍රචණ්ඩත්වය නියෝජනයවේ. එම කැරලි දෙකම කෙටි කාලයකට සීමා විය. ද්‍රවිඩ විමුක්ති කොටි සංවිධානය විසින් ආරම්භ කළ දේශපාලන ප්‍රචණ්ඩත්වය මගින් දිග්ගැස්සුන ගරිල්ලා යුද්ධයක් නිරූපණය වේ. ජ.වි.පෙ. දේශපාලන ප්‍රචණ්ඩත්වය යුධමය වශයෙන් පරාජය කළද එය නැවත නැවතත් ඉස්මතු වීමේ ප්‍රවණතාවක් දක්නට තිබූ අතර ද්‍රවිඩ විමුක්ති කොටි සංවිධානයට අඛණ්ඩව ගරිල්ලා යුද්ධය පවත්වා ගැනීමේ හැකියාව ලැබී තිබිණි. එබඳු වෙනස්කම් පැවතියද ඉතා සමානවූ ලක්ෂණයන්ද උතුරු හා දකුණු දේශපාලන ප්‍රචණ්ඩත්වයෙන් වෙතින් පෙන්නුම් කළේ ය.

පළමු උතුරු මෙන්ම දකුණු දේශපාලන ප්‍රචණ්ඩත්වය අහඹු සිදුවීම් නොව කාලාන්තරයක් තුළ සැළසුම් කොට, සංවිධානයන් විසින් ක්‍රියාත්මක කරනු ලැබුවකි. එම සංවිධානයන් බහුල වශයෙන් තරුණයන්ගෙන් සංයුක්තව ඇත. ඔවුන් එක හා සමාන සමාජ ආර්ථික පසුබිමකින් පැවත එන්නෝය.

දෙවනුව දේශපාලන ප්‍රචණ්ඩත්වයන් දෙක වෙතින්ම රටෙහි සමාජ ආර්ථික හා දේශපාලනික ව්‍යුහය අභියෝගයට ලක්කොට ඇත. මෙහිදී ජ.වි.පෙ. මෙන්ම එල්.ටී.ටී.ඊ සංවිධානයද තම දේශපාලන පරමාර්ථයන් ඉටු කර ගැනීම සඳහා ත්‍රස්තවාදය හා ගරිල්ලා උපක්‍රම භාවිත කරති. ජ.වි.පෙ. දෙවරක්ම ආණ්ඩු බලය ලබා ගැනීම සඳහා ප්‍රචණ්ඩත්වය භාවිත කළද ඒවා සාර්ථක ලෙස රජය විසින් මර්දනය කරන ලදී. එසේ වුවද නැවත වරක් එමඟින් දේශපාලන ප්‍රචණ්ඩත්වය ඇති වීමේ ප්‍රවණතාවයක් දක්නට ලැබිණි. එයට සමාන්තර ගරිල්ලා යුධ හා ත්‍රස්තවාදය මිශ්‍රව දිග්ගැසුන යුද්ධයක් ගෙන යාමේ හැකියාව උතුරේ දේශපාලන ප්‍රචණ්ඩතවය වෙතින් පෙන්නුම් කළේ ය.

## 1971 අප්‍රේල් හා 1989 - 89 කැරැල්ල

ශ්‍රී ලංකාවේ දේශපාලන ප්‍රචණ්ඩත්වය පිළිබඳ විමසීමේදී අවබෝධකර ගැනීමේ පහසුව සඳහා එක් එක් ප්‍රචණ්ඩත්වය වෙන් වෙන් වශයෙන් විමසා බැලිය යුතුය. මෙහිදී පළමුව ජ.වි.පෙ. විසින් දියත් කරනු ලැබූ 1971 අප්‍රේල් කැරැල්ල සහ 1987 - 89 කැරැල්ල සම්බන්ධව අවධානය යොමු කළ හැකිය.

ජ.වි.පෙ. පළමු කැරැල්ල 1971 අප්‍රේල් 5 වන දින රාත්‍රියේ දිවයිනේ පොලිස් ස්ථාන 100 කට ආසන්න ප්‍රමාණයකට ආයුධ සන්නද්ධ පහරදීම් මඟින් ආරම්භ විණි. එමඟින් ගම්බද ප්‍රදේශවල පොලිස් ස්ථාන 5 ක් අල්ලා ගැනීමට හැකිවූ අතර පොලිස් ස්ථාන 44 ක් ආරක්ෂක තත්ත්වයන් මත අත්හැර දැමීය. එම කැරැල්ල කෑගල්ල, ගාල්ල, අනුරාධපුර, කුරුණෑගල, පොළොන්නරුව, මාතර, අම්පාර හා මොණරාගල යන දිස්ත්‍රික්කවලට සීමා විය. ඇලිපිටිය, මහව, දෙණියාය, හොරොව්පතාන සහ වරකාපොල යන කුඩා නගර තාවකාලික ලෙස ජ.වි.පෙ. යටතට පත්විය. අප්‍රේල් කැරැල්ල සුමාන තුනක් වැනි කෙටි කාලයක් තුළදී පරාජය කිරීමට රජය සමත් විය. ජනවාර්ගික වශයෙන් ද්‍රවිඩ හා මුස්ලිම්වූත්, ආගමික වශයෙන් ක්‍රිස්තියානිවූත්, බහුතරයක් වාසය කරන ප්‍රදේශවල කිසිදු සිදුවීමක් වාර්තා නොවූ අතර කැරැල්ල සිංහල බෞද්ධ ප්‍රදේශවලට සීමා විය. රජයේ සංඛ්‍යා ලේඛනවලට අනුව කැරැල්ල වෙතින් 1200 ක් මිය ගොස් ඇත. එසේ වුවද සාමාන්‍ය වශයෙන් 5000 ක් පමණ මිය යන්නට ඇතැයි විශ්වාස කළ හැක. කැරැල්ල හා සම්බන්ධව 1800 ක් පමණ අත්අඩංගුවේ පසුවූ අතර 3908 කට පමණ දඬුවම් ලැබිණි.

ජ.වි.පෙ.හි දෙවන කැරැල්ල 1987-1989 අතර කාලයෙහිදී ක්‍රියාත්මක විය. එම කැරැල්ල ඇතිවීමට හේතුවූ කෙටි කාලීන සාධක අතුරින්

1983 ජාතිවාදී කෝලාහල සම්බන්ධව තහනම් කිරීම හා 1987 ඉන්දු ශ්‍රී ලංකා ගිවිසුම යටතේ ඉන්දියානු සාම හමුදාව ශ්‍රී ලංකාවට පැමිණීමද වැදගත්වේ. මෙම කැරැල්ලෙහි කෙටි කාලීන පරමාර්ථයන් ලෙසට 1987 ඉන්දු ශ්‍රී ලංකා ගිවිසුම අවලංගු කිරීම, ඉන්දීය සාම හමුදාව ඉවත් කිරීම, පළාත් සභා ක්‍රමය අහෝසි කිරීම, නව පාර්ලිමේන්තු සහ ජනාධිපතිවරණ පැවැත්වීම හා නීත්‍යනුකූල නොවූ හමුදාවන් විසුරුවා දැමීම සඳහන් කළ හැක.

ජ.වි.පෙ. විසින් තම පරමාර්ථයන් ඉටුකර ගැනීම සඳහා ප්‍රචණ්ඩත්වය ඔස්සේ ආණ්ඩු පාක්ෂික දේශපාලනඥයින්, පොලීසියෙහි හා අනෙකුත් ආරක්ෂක අංශයන්හි නිළධාරීන් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්, රාජ්‍ය නිළධාරීන්, විරුද්ධ පක්ෂයන්හි දේශපාලකයින් හා ඔවුන්ගේ සහායකයින් හා සාමාන්‍ය ජනතාව ඉලක්ක කරගනු ලැබිණි. එලෙස ත්‍රස්තවාදය හා පුද්ගල ඝාතනය මගින් රජයේ ක්‍රියාකාරීත්වය අඩපණ කිරීම ජ.වි.පෙ. පරමාර්ථය විය. එයට අමතරව ජ.වි.පෙ. විසින් තෝරා ගත් පොලිස් ස්ථාන හා හමුදා ස්ථානයන්ටද පහර දෙන ලදී. එමෙන්ම ජ.වි.පෙ. විසින් ග්‍රාමීය බැංකු, සමුපාකාර, රජයේ පරිපාලන ආයතන හා තැපැල් කාර්යාලයන්ද අකර්මන්‍ය කළ අතර දිවයිනේ විවිධ පළාත්වලදී රජයේ වාහනවලටද අලාභ සිදු කෙරිණි. ඒ අතරතුර ජ.වි.පෙ. ආයුධ සන්නද්ධ අරගල උපායෙහි අංශයක් ලෙසට වැඩ වර්ජනය හා මහජන පෙළපාළිද සංවිධානය කළේ ය. මෙම පෙළපාළි සඳහා රජයේ පාසල් සිසුන් ජ.වි.පෙ. විසින් බහුලව භාවිත කරනු ලැබිණි. 1971 අප්‍රේල් කැරැල්ල හා සංසන්දනාත්මකව සැලකීමේදී 1987 - 89 දී සිදුවූ කැරැල්ල වඩාත් සංවිධානාත්මක හා ව්‍යාප්ත වූවක්වන අතරම බහුලව ත්‍රස්තවාදයද භාවිත කරන ලදී. එය දිවයිනෙහි දකුණ, උතුරු මැද, මධ්‍යම හා බටහිර පළාත්හි ප්‍රබලව ක්‍රියාත්මකවී ඇත.

ජ.වි.පෙ. දෙවන කැරැල්ල නිසා මිය ගිය සංඛ්‍යාව ස්ථිර වශයෙන්ම ප්‍රකාශ කළ නොහැක. එමගින් ආරක්ෂක අංශයට අයත් 178 ක් හා පොලීසියට අයත් 319 ක් මිය ගොස් ඇත. එයට අමතරව 30000 කට අධික ජ.වි.පෙ. සාමාජිකයින් හා හිතවතුන් ප්‍රමාණයක්ද ජීවිතක්ෂයට පත්වූ අතර 10000 කට වැඩි ප්‍රමාණයක් අත්අඩංගුවට ගෙන ඇත. ජීවිතක්ෂයට පත්වූවන් අතර ජ.වි.පෙ. නායක රෝහණ විජේවීර ඇතුළු දේශපාලන සහ මධ්‍යම කාරක සභිකයෝද වෙති.

## ඊලාම් යුද්ධය

ද්‍රවිඩ විමුක්ති කොටි සංවිධානය මත පදනම්වූ ගරිල්ලා යුද්ධය වෙතින් දේශපාලන ප්‍රචණ්ඩත්වයෙහි ජනවාර්ගික ස්වභාවය නිරූපණය වන බව සඳහන් කළ හැක. ඒ සම්බන්ධව විමසීමට පෙරාතුව ඒ හා සම්බන්ධ බලපෑම් කරනු ලැබූ දේශපාලන ප්‍රචණ්ඩත්වයන් දෙකක් පිළිබඳ සඳහන් කළ යුතුය. පළමු සිදුවීම වශයෙන් 1971 අප්‍රේල් කැරැල්ල සඳහන් කළ හැක. එමගින් පළමුවෙන් දේශපාලන පරමාර්ථයන් මුදුන්පත් කර ගැනීමේදී ප්‍රචණ්ඩත්වය භාවිත කිරීමේ ඇති වැදගත්කම අනාවරණය විය. 1971 සිදුවීම් මතින් ආරක්ෂක අංශයෙහි දුබලතාවන් පිළිබඳ අවබෝධයක්ද ලබාගත හැකි විය.

උතුරේ ගරිල්ලා යුද්ධය සඳහා ආසන්න ලෙස කලාපීය වශයෙන් බලපෑම් කරනු ලැබූ සිදුවීමක් ලෙස 1971 දී නැගෙනහිර පකිස්ථානය බටහිර පකිස්ථානය වෙතින් ස්වාධීනව බංගලාදේශය වශයෙන් වෙනම රාජ්‍යයක් පිහිටුවීම සඳහන් කළ හැක. එහිදී ඉන්දියාව ඉතා වැදගත් කාර්යක් ඉටු කළේය. එම සිදුවීම මගින් දකුණු ආසියානු කලාපය තුළ වෙනම රාජ්‍යයක් පිහිටුවීමේදී ඉන්දියාව මැදිහත් වීමේ වැදගත්කම පෙන්වාදී ඇත.

උතුරේ ගරිල්ලා යුද්ධය අවබෝධ කර ගැනීමේ පහසුව සඳහා ප්‍රධාන අදියර තුනකට බෙදා වෙන් කෙරේ. මෙහි පළමු අදියර 1970 මැදභාග යේ සිට මාර්තු 1990 දක්වා කාලයවේ. මෙම අදියරය පළමු ඊලාම් යුද්ධය වශයෙන් ප්‍රසිද්ධ ය. ආරම්භයේදී සංවිධානයන් ගණනාවක් පැවතුන අතර එල්.ටී.ටී.ඊ, ටෙලෝ, ප්ලොට්, ඊ.පී., ආර්.එල්.එෆ් හා ඊරෝස් ප්‍රමුඛත්වය ගත්හ. මධ්‍යස්ථ ද්‍රවිඩ දේශපාලනඥයින් ඝාතනය කිරීම හා පොලිස් සහ හමුදා ඔත්තුකරුවන් මරා දැමීම, බැංකු මංකොල්ලය වැනි සිදුවීම් සිදු විණි. මෙකල සිදුවූ ප්‍රසිද්ධ ඝාතනයක් වශයෙන්

යාපනයෙහි නගරාධිපති ඇල්ෆ්‍රඩ් දුරයප්පා ඝාතනය කිරීම සඳහන්වේ. 1977 සිට උතුරු පළාතෙහි පොලීසිය සහ හමුදා අංශයන්ට පහර එල්ලවූ අතර 1984 දී උතුරු හා නැගෙනහිර පළාත්හි ගම්මානවල හා ජනපදයන්හි වාසය කරනු ලබන සිවිල් ජනතාව ඝාතනයට ලක් වූහ. මේ අතරතුරදී අනුරාධපුරය හා කොළඹ නගරයද ත්‍රස්තවාදී පහරදීම්වලට ලක් විය.

1987 දී ඉන්දු ලංකා ගිවිසුමෙන් පසු ඊලාම් යුද්ධය සම්පූර්ණයෙන්ම එල්.ටී.ටී.ඊ ය විසින් ක්‍රියාත්මක කෙරිණි. පළමුව එය අන් ද්‍රවිඩ කණ්ඩයම් හා සටන් කළ අතර මුස්ලිම් හා සිංහල ජනතාවටද පහර දුන්නේය. විශේෂයෙන්ම උතුරු හා නැගෙනහිර පළාත් සභාව පාලනය කරනු ලැබූ ඊ.පී.ආර්.එල්.එෆ්. සමඟ ගැටුම් ඇති විය. එයට අමතරව ඉන්දියානු සාම හමුදාව සමඟද එල්.ටී.ටී.ඊ ය ගරිල්ලා යුධ කළේය. 1990 මාර්තු අගදී ඉන්දියානු සාම හමුදාව දිවයිනෙන් පිටවී යන තෙක්ම එමගින් ඉන්දියානු හමුදා භටයන් 1155 ක් හා එල්.ටී.ටී.ඊ භටයින් 1400 ක් මිය ගොස් ඇත. මෙම කාලය තුළදී රජය සහ එල්.ටී.ටී.ඊ ය අතර සටන් විරාමයක් පැවතුන අතර සාම සාකච්ඡා කිහිපයක්ද පැවැත්විණි.

1990 ජුනි මාසවලදී රජය සමඟ පැවති සාම සාකච්ඡා බිඳ වැටීමත් සමඟම දෙවන ඊලාම් යුද්ධය ආරම්භ විණි. ආරම්භයේදී නැගෙනහිර පළාත්වල පැවති පොලිස් හා ආරක්ෂක ස්ථාන පහරදීම් වලට ලක් විණි. මෙම අදියරේදී එල්.ටී.ටී.ඊ ය විසින් සිදු කරනු ලැබූ වැදගත් පහරදීම් වශයෙන් 1990 යාපනය බල කොටුව, 1991 දී අලිමංකඩ සහ මාන්කුලම් හා 1993 දී පුනරින් හමුදා කඳවුරට පහරදීම යනාදිය සඳහන් කළ හැකිය. මෙම අදියර තුළදී එල්.ටී.ටී.ඊ ය විසින් සිදු කරනු ලැබූ ප්‍රධාන දේශපාලන ඝාතන වශයෙන් ජාතික ආරක්ෂක ඇමති රංජන් විජේරත්න (March 1991) හිටපු ඉන්දීය අගමැති රජිව් ගාන්ධි (July 1990) හිටපු ජාතික ආරක්ෂක ඇමති ලලිත් ඇතුලත්මුදලි (April 1993) ජනාධිපති ආර්. ප්‍රේමදාස (May 1993) හා ජනාධිපති අපේක්ෂක ගාමිණී දිසානායක (November 1994) යන ඝාතන සඳහන්ය.

මෙහිදී එල්.ටී.ටී.ඊ ය විසින් නැගෙනහිර පළාත්හි පදිංචි සාමාන්‍ය මුස්ලිම් ජනතාවද ඝාතනයට ලක් කොට ඇත. මේ අතුරින් 1992 පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පල්ලියගොඩැල්ලෙහි හා මඩකලපුව දිස්ත්‍රික්කයේ කල්මුනෙහිවූ සිදුවීම් දැක්විය හැක. 1990 ඔක්තෝබර් මාසයේදී උතුරු ප්‍රදේශයේ මුස්ලිම් ජනතාවගේ දේපළ රාජසන්තක කළ අතර පළාතෙන්ද පිටුවහල්කරන ලදී. දෙවන ඊලාම් යුද්ධයෙන් ආරක්ෂක අංශයන්හි 11000 ක් ද සාමාන්‍ය වැසියන් හා ගරිල්ලා භටයන් 12000 ක් ද මියගොස් ඇත.

1985 අප්‍රේල්හිදී ත්‍රිකුණාමලය වරායෙහි නාවික හමුදාව අයත් යාත්‍රා දෙකකට පහරදීම මගින් තෙවන ඊලාම් යුද්ධය ආරම්භ විණි. එයට මූලික හේතුව වූයේ 1994 දෙසැම්බර් මස සිට ආණ්ඩුව හා එල්.ටී.ටී.ඊ ය අතර පැවති සටන් විරාමය හා සාම සාකච්ඡා බිඳ වැටීමයි. මෙහි දී ආරක්ෂක අංශය යාපනය නැවත අල්ලා ගත් අතර එල්.ටී.ටී.ඊ ය වන්නි ප්‍රදේශයෙහි කැලෑවට පසු බැස්සේය. ආර්ථික ඉලක්කයන්ට පහර දීම, කොළඹ නගරය තුළ බෝම්බ පුපුරුවා හැරීම හා උතුරු හා නැගෙනහිර හුදෙකලා ගම්මානවලට පහර දීම එල්.ටී.ටී.ඊ විසින් සිදු කොට ඇත. 1996 ද කොළඹ මධ්‍යම බැංකුවට පහරදීම හා මගීන් ප්‍රවාහන දුම්රියක බෝම්බ පිපිරවීමද එල්.ටී.ටී.ඊ ය විසින් සිදු කරනු ලැබූ ප්‍රබල සිද්ධීන්ය. ඊලාම් යුද්ධය 2009 මැයි මාසයේදී සහමුලින්ම පරාජයට පත් විය.

## ආණ්ඩුවෙහි ප්‍රතිචාරය

දේශපාලන ප්‍රචණ්ඩත්වය පිළිබඳ අධ්‍යනය කිරිමේදී ඒ හා සම්බන්ධ ආණ්ඩුවේ ක්‍රියාකාරීත්වයද ඉතා වැදගත්වූවක් ලෙස සැලකේ. පොදුවේ දේශපාලන ප්‍රචණ්ඩත්වය සම්බන්ධ ආණ්ඩුවේ ක්‍රියාකාරීත්වය තුළ අඛණ්ඩත්වයක් නොමැති අතර එය ආණ්ඩුවෙන් ආණ්ඩුවට හා දේශපාලන ප්‍රචණ්ඩත්වයෙන් ප්‍රචණ්ඩත්වයට වෙනස්වී ඇත. එමෙන්ම ඒ සම්බන්ධව ජාතික සැලැස්මක් නොමැති බවද සඳහන් කළ යුතුය.

ප්‍රධාන වශයෙන් ආණ්ඩුවෙහි ක්‍රියාකාරීත්වය මූලික කොටස් දෙකකට බෙදා වෙන් කළ හැකිය. පළමු අංශය යුධමය හා නීතිමය වන අතර

දෙවන අංශය සමාජ, ආර්ථික හා දේශපාලන ප්‍රතිසංස්කරණයන්ය. ආණ්ඩුවක එම ක්‍රියාමාර්ග යන්ගේ ක්‍රියාකාරීත්වය මූලික වශයෙන් ආණ්ඩුවෙහි දේශපාලන වුවමනාව, ආරක්ෂක සේවාවන්හි හැකියාව හා ශක්තිය, විදේශීය රාජ්‍යයන් වෙතින් යුධමය ආධාර ලැබීමේ හැකියාව හා දේශපාලන ප්‍රචණ්ඩත්වයෙහි ස්වභාවය හා ආකාරය මත රඳා පවතී.

ජ.වි.පෙ පළමු කැරැල්ල මැඩ පැවැත්වීම සඳහා ආණ්ඩුව විසින් යුධමය හා නීතිමය ප්‍රතිපත්තියක් අනුගමනය කරන ලදී. පළමු කැරැල්ලට සාපේක්ෂව දෙවන කැරැල්ලේදී ආණ්ඩුව විසින් ඉතා තදබල ක්‍රියා මාර්ගයන් අනුගමනය කළේය. ආණ්ඩුව දෙවන කැරැල්ල මර්දනය කිරීම සඳහා ජ.වි.පෙ සහ එහි හිතවතුන්ට නීතිමය තත්ත්වයන්ගෙන් බැහැරවූ ක්‍රියාමාර්ගද භාවිත කර ඇත. එයට වෙනස්ව උතුරේ දේශපාලන ප්‍රචණ්ඩත්වය පාලනය කිරීම සඳහා ආණ්ඩුව විසින් යුධමය ක්‍රියා මාර්ගයන්ට අමතරව දෙමළ ජනතාවගේ ගැටලු නිරාකරණය කිරීමටද ප්‍රයත්නයන් දරා තිබේ.

## දේශපාලන ප්‍රචණ්ඩත්වයෙහි ප්‍රතිවිපාක

දේශපාලන ප්‍රචණ්ඩත්වයන් වෙතින් ඉතා අහිතකර වූ සමාජ, ආර්ථික හා දේශපාලනික ප්‍රතිවිපාක බිහිකොට ඇත. වාර්ෂිකව උතුරේ යුද්ධය සඳහා රුපියල් බිලියන 18 කට වඩා වැඩි ප්‍රමාණයක් වැය වේ. දේශපාලන ප්‍රචණ්ඩත්වය හේතු කොට ගෙන වාර්ෂිකව ජාතික අයවැයෙන් 18% කට වඩා වැඩි මුදලක් ආරක්ෂක කටයුතු සඳහා වැය කරනු ලැබේ. රජය සහ එල්.ටී.ටී.ඊ ය අතර ඇති යුද්ධය සඳහා 1996 වන විට රුපියල් බිලියන 228 ක් වැය කොට ඇත.

දේශපාලන ප්‍රචණ්ඩත්වය හේතුවෙන් ඉතා විශාල සංඛ්‍යාවක් ජීවිතක්ෂයට පත්වී ඇත. හදිසි නීති පිළිබඳ රෙගුලාසි හේතු කොටගෙන දේශපාලන ප්‍රචණ්ඩත්වය මගින් මිය ගිය පුද්ගලයින් පිළිබඳ නිවැරදි සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කළ නොහැකිවී ඇත. දළ වශයෙන් මේ වනවිටදී ලක්ෂයකට ආසන්න සංඛ්‍යාවක් මිය ගොස් ඇතැයි අනුමාන කළ හැකිය. 1996 වන විටදී උතුරු යුද්ධය හේතුවෙන් අවතැන් වූවන්ගේ ප්‍රමාණය දසලක්ෂයක් පමණවේ.

දිගු කාලීන දේශපාලන ප්‍රචණ්ඩත්වය හේතුකොට ගෙන ඇතිවූ ප්‍රතිඵලයක් ලෙස මිලිටරිකරණය සඳහන් කළ හැකිය. 1963 දී යුධ හමුදාව 12000 ක් පමණ සමන්විත අතර 1998 දී එය 150000 ක් දක්වා වර්ධනය වී ඇත. මෙයට අමතරව 1978 දී සම්මත කරනු ලැබූ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (Prevention of Terrorsn Act) පළමුව උතුරු යුද්ධය සඳහාත් පසුව 1987 දී ජ.වි.පෙ. දෙවන කැරැල්ල සඳහාත් භාවිත කරනු ලැබිණි.

අවසාන වශයෙන් දේශපාලන ප්‍රචණ්ඩත්වය මගින් සමාජය තුළ ප්‍රචණ්ඩත්වය පිළිබඳ මිත්‍යාවක් හා පූජාවිධියක් (Cult) මෙන්ම භීතිය පිළිබඳ වාතාවරණයක් බිහිකොට ඇත. ප්‍රචණ්ඩත්වය පිළිබඳ ගැටළුව නිරාකරණය කිරීම සම්බන්ධව පුළුල් රාජ්‍ය ප්‍රතිපත්තියක් නොමැති වීම හේතු කොට ගෙන ප්‍රචණ්ඩ සංස්කෘතියක් උපදවා ඇත. එය දේශපාලන ප්‍රචණ්ඩත්වය හා ප්‍රති ප්‍රචණ්ඩත්ව ව්‍යූහය තුළ හොඳින් වර්ධනයවේ.

## නිර්දේශ හා සමාලෝචන

ශ්‍රී ලංකාවේ දේශපාලන ප්‍රචණ්ඩත්වය පිළිබඳ ගැටළුව සම්බන්ධව ඉක්මන් විසඳුම් නොමැත. එය ඉතා ගැටුම් සහගත ප්‍රචණ්ඩත්වයක්වන අතර ඒ සම්බන්ධ ඉතා සූක්ෂම හා විධිමත් විග්‍රහයක් අවශ්‍යවේ. ඒ සම්බන්ධව විසඳුමක් සැපයීමේදී පහත සඳහන් කාරණාවන් පිළිබඳ අවධානය යොමු කළ යුතුය.

දේශපාලන ප්‍රචණ්ඩත්වය යනු ආරක්ෂාව පිළිබඳ පමණක් නොව පුළුල් සමාජ, ආර්ථික හා දේශපාලන අර්බුදයක් පිළිබඳ ප්‍රකාශනයකි. එනිසා එයට විසඳුම් ඉදිරිපත් කිරීමේදී යුධමය හා යුධමය නොවන ක්‍රියා පිළිවෙත් පැවතිය යුතුය. ශ්‍රී ලංකාවේ දේශපාලන ප්‍රචණ්ඩත්වයෙහි ස්වභාවය, ව්‍යාප්තිය හා විශාලත්වය සැලකීමේදී කාර්ය සාධක ප්‍රචණ්ඩත්වය මැඩලීමේ ජාතික ප්‍රතිපත්තියක අවශ්‍යතාවය ඉස්මතුවේ. රෝබට් තොම්සන් (Robert Thompson) විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශයන් ප්‍රචණ්ඩත්වය සම්බන්ධවූ ආණ්ඩුවේ ප්‍රතිපත්තීන්ට අන්තර්ගත විය යුතුය.

ඒවා මෙසේ සඳහන් කළ හැකිය. ආණ්ඩුව නීතියට අනුකූලව ක්‍රියාත්මක විය යුතුය. එයට යුධමය පමණක් නොව සමාජ, ආර්ථික, දේශපාලනික හා පරිපාලන ඇතුළත් පුළුල් සැලැස්මක් තිබිය යුතුය. ආණ්ඩුව විසින් ගරිල්ලා භටයින්ට වඩා දේශපාලන විපර්යාසයන් කළ යුතුය.

දෙවනුව ආණ්ඩුව විසින් රටේ දේශපාලන ක්‍රමයෙහි නීත්‍යනුකූලභාවය ආරක්ෂා කළ යුතුය. මේ අනුව ප්‍රජාතන්ත්‍රවාදය හා නීතියෙහි ආධිපත්‍ය ආරක්ෂා කළ යුතුය. මේ සඳහා මැතිවරණ නිදහස්ව හා සාධාරණව පැවැත්වීම, දේශපාලන සහභාගීත්වය සඳහා සමාන අවස්ථාවන් ලබාදීම හා ප්‍රධාන දේශපාලන පක්ෂ අතර අන්‍යෝන්‍ය අවබෝධය පැවතිය යුතුය.

දේශපාලන ප්‍රචණ්ඩත්වයට විකල්ප වශයෙන් ප්‍රජාතන්ත්‍රවාදය වර්ධනය කිරීමේ තවත් අංශයක් ලෙස ග්‍රාමීය අංශය දක්වා බලය බෙදීමේ ප්‍රතිපත්තිය පුළුල් කිරීම සඳහන් කළ හැකිය. කලාපීය හා උපකලාපීය සංවර්ධනය හා තීන්දු ගැනීමේ ක්‍රියාවලිය සඳහා ග්‍රාමීය මට්ටමේ සංවිධානයන්හි සහභාගීත්වය සහ එම ග්‍රාමීය සංවිධානයන් තුළ තරුණ සහභාගීත්වය නියෝජනය කිරීම බලය බෙදීමේ ප්‍රතිපත්තියෙහි පරමාර්ථ විය යුතුය.

ශ්‍රී ලංකාවේ දේශපාලන ප්‍රචණ්ඩත්වයෙහි විසඳීම මූලික මිනිස් අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා නීතියෙහි ආධිපත්‍ය ආරක්ෂා කිරීම මත රඳා පවතිනු ඇත. මේ අනුව ප්‍රචණ්ඩත්වය මර්දනය කිරීම සඳහා රජය විසින් ගෙන යනු ලබන ක්‍රියා මාර්ගයන්හිදී මිනිස් අයිතීන් පිළිබඳ ධර්මතාවයන් උල්ලංඝනය නොවිය යුතුය. මෙහිදී නීතියෙහි ආධිපත්‍ය හා අධිකරණයෙහි ස්වාධීනත්වය ආරක්ෂා කිරීමද ඉතා අත්‍යාවශ්‍යය.

දේශපාලන ප්‍රචණ්ඩත්වය නිරාකරණය කිරීම සඳහා ජනවාර්ගික සමගිය මෙන්ම සමාජ සමගියද තහවුරු කළ යුතුවේ. මේ සඳහා ආණ්ඩුව විසින් සියළුම ආකාරයේ විවෘත හා ආවෘත ජනවාර්ගික හා දේශපාලන වෙනස්කම් ඇති නොවන ලෙසට වගබලා ගත යුතුය. ආණ්ඩුව විසින් ජනවර්ග හා මැතිවරණ අරගල ඇතිවීම වැළැක්වීම සඳහා කටයුතු කළ යුතුය. මේ වනවිට දී ජනවාර්ගික අරගලය ඇති වීම මැඩපවත්වා ඇති වුවද මැතිවරණ ප්‍රචණ්ඩත්වයක් වැළැක්වීමට අපොහොසත්ව ඇත.

ශ්‍රී ලංකාවේ දේශපාලන ප්‍රචණ්ඩත්වය පිළිබඳ ගැටලුව උතුරේ පමණක් නොව දකුණේද පවතින්නකි. මේ තත්ත්වය තුළ ගරිල්ලා කණ්ඩායම් හා ප්‍රචණ්ඩවාදී දේශපාලන පක්ෂ සාකච්ඡා මගින් ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ප්‍රවාහයට සම්බන්ධ කර ගත යුතුය. මෙහිදී ආණ්ඩුව විසින් එල්.ටී.ටී.ඊ පමණක් නොව ජ.වි.පෙ. සම්බන්ධවත් අවධානය යොමු කළ යුතුය.

ඉහත විග්‍රහයට අනුව ශ්‍රී ලංකාව තුළ ජනවාර්ගික හා පන්තිමය සාධකය මත පදනම්ව දිගුකාලීන ප්‍රචණ්ඩත්වයක් ක්‍රියාත්මක විය. එල්.ටී.ටී.ඊ ය වෙතින් ජනවාර්ගික සාධකය මත පදනම්වූ උතුරේ යුද්ධය නියෝජනයවන අතර ජ.වි.පෙ වෙතින් පංතිය පදනම් කරගත් දකුණේ ප්‍රචණ්ඩත්වය ක්‍රියාත්මක විය. ශ්‍රී ලංකාවේ සාමාජීය වෙනස්වීම්වලට සමාන්තර ආර්ථික හා දේශපාලනික වර්ධනයක් නොවීම දේශපාලන ප්‍රචණ්ඩත්වයට මුල්වී ඇත. මේ අනුව දේශපාලන ප්‍රචණ්ඩත්ව මැඩලීම සඳහා ආර්ථික සංවර්ධනයට මග පාදනු ලබන දේශපාලන සංවර්ධනයක් ඇති කළ යුතුය.

## ආශ්‍රිත ග්‍රන්ථ හා ලිපි:


Alles, A. C. (1971). *Insurgency- 1971.* Colombo: Apothecaries Co. Ltd.

Balasuriya, Mahinda. (2009). *The Rise and Fall of the LTTE*. Colombo: Asian Network on Conflict Research.

Chandreprema, C.A. (2012). *Gota's War, The Crushing of Tamil Tiger Terrorism in Sri Lanka.* Colombo: Ranjan Wijerathna Foundation.

De Silva, Jayatileke (Ed.). (2009). *Chronology of LTTE Terror*. Colombo: The Associated News Papers of Ceylon Limited.

Ethnic Conflict and Guerrilla Warfare of the Liberation Tigers of Tamil Eelam. (2002). in Phukon and Girin (Eds.), *Ethnicity and Polity in South Asia* (pp. 149-169). News Delhi: South Asian Publishers.

Gunarathne, Rohan. (1990). *Sri Lanka, A Lost Revolution? The Inside Story of the JVP*. Kandy: Institute of fundamental Studies.

Huntington, Samuel P. (1968). *Political Order in Changing Societies*. New Heaven: Yale University Press.

Marino, Eduardo. (1989), *Political Killings in Southern Sri Lanka: On the Brink of Civil War*. London: International Alert Publication.

Obeysekara, G. (1974). Some Comments on the 1971 Insurgency in Sri Lanka (Ceylon). *Journal of Asian Studies*, 33(3), 367-384.

Peiris, Gerald. (1999). Insurrection and Youth Unrest in Sri Lanka, in History and Politics: Millennial Perspectives'. In Peiris, Gerald and Samarasinghe, S.W.R. De A (Eds.), *Essays in Honour of Kingsley De Silva* (pp.185-200). Colombo: Law and Society Trust.

Political Terrorism of the Liberation Tigers of Tamil Eelam (LTTE) in Sri Lanka. (2009). in Kumaraswamy, P.R. and Copland, Ian (Eds.), *South Asia: The Spectre of Terrorism* (pp. 175-187). London: Routledge.

Report of the Presidential Commission on Youth Commission. (1990). *Sessional Papers*, 1. Colombo: Department of Government Printing.

Samaranayake, G. (1997). Political Violence in Sri Lanka: A Diagnostic Approach. *Terrorism and Political Violence*, 9 (2), 99-119.

Senaratne, Jagath P. (1990). Political Violence in Sri Lanka 1977-1990. *Riots, Insurrections, Counter- Insurgencies, Foreign Intervention*. Amsterdam: VU University Press.

Swamy, M.R. Narayan. (1994). *Tigers of Sri Lanka: From Boys to Guerrillas*. New Delhi: Konak Publishers.

Wilkinson, Paul. (1986). *Terrorism and the Liberal State*. London: Macmillan.